පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492
ආයතනයේ නම :- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 492
நிறுவனத்தின் பெயர்:- மாவட்ட செயலகம் அம்பாறை
பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)இன் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 492
Name of the institution: - District Secretariat Ampara
Submission of observation of Hon. Minister and Steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of Standing Order No.119 (4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා 492

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

| රා.ගි.කා.සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම් | ගණන්දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| පළමු කොටස: 92.00 | | |
| i) අනවසර අල්ලා ගැනීම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත. | දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් මේ සම්බන්ධව ලේඛන පවත්වාගෙන යන අතර, නියමිත පරිදි වාර්තා ලබා ගෙන යාවත්කාලීන කරන ලෙස දැනුම් දී ඇත. | දැනට වාර්තා වන තොරතුරු සාරාංශයේ පිටපත් දිස්ත්‍රික් ලේකම් වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. |
| ii) අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත | යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස දැනුම් අදාල අංශ වෙත දැනුම් දී ඇත | 2024 වර්ෂයේ සිට අඛණ්ඩව යාවත්කාලීනව පවත්වා ඇත |
| ii) 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව වැටුප් සැකසීමේ පරිගණක මෘදුකාංගයේ මුරපදය තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි. | 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් පිලිපදින ලෙස ගණකාධිකාරිවරුන් දැනුවත් කර ඇත | අදාල චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කර ඇත |
| iii) විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිලිතුරු සපයා නොතිබුණි. | අභ්‍යන්තර චක්‍රලේඛ හා උපදෙස් මගින් ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | ඒ අනුව කටයුතු කරමින් පවති. |
| iv) සියළු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත | අම්පාර දිස්ත්‍රික් ලේකම් වෙත හිමිකාරිත්වය නොමැති වාහනවල අයිතිය මාරුකර ගැනීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය සමඟ සම්බන්ධිකරණයෙන් කටයුතු කරමින් පවතින අතර එවැනි වාහන 11ක පැවරීම් කටයුතු සිදුකිරීම සඳහා ලියාපදිංචි සහතික අනුපිටපත් ලබා ගැනීමට කටයුතු කර ඇත | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය සමඟ සම්බන්ධිකරණයෙන් කටයුතු කරමින් පවති. |
| v) සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි | සියළුම සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත. | ඒ අනුව කටයුතු කර ඇත. |
| vi) වාහනයක් ගර්භිත වි මාස 8ට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි. | භාවිතා කළ නොහැකි වාහන කාණ්ඩ තුනකට අයත් වේ එනම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් හා වෙනත් ආයතන සතු වාහන වේ. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට | පිළිතුරු සම්බන්ධව සිහිකැඳවීම් යොමු කර ඇති අතර, දැනට යම්කිසි මට්ටමකට අළුත්වැඩියා කර භාවිතා කිරීමට හැකි වාහන ගුවන් හමුදාව වෙත භාර දීමට කටයුතු කරමින් පවති. |

| | | |
|---|---|---|
| | අයත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ගර්හිත වාහන සියල්ල 2024.11.08 වෙන්දේසි කර අවසන් කර ඇත. අනෙකුත් ගර්හිත වාහන වෙනත් ආයතන වලට අයත් වාහන වේ. මෙහි ඉදිරි කටයුතු කිරීම ගැටළු සහගත වී ඇත. මේ සම්බන්ධව උපදෙස් ඉල්ලා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් හා මහා භාණ්ඩාගාරය වෙත ලිපි යොමුකර කර ඇති අතර , මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. | |
| vii)රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව නිසි ලෙස කටයුතු කර නොතිබුණි | දැනට වාහන අනතුරු සම්බන්ධව මු.රෙ. 104 යටතේ කටයුතු කර අදාළ ආකෘති පත්‍ර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. (AMP/ADMN/VEHIC/23/KQ6633-Accident හා 2024.08.07 දිනැති ලිපිය) අනෙකුත් රථ වාහන අනතුරු සඳහා මූලික විමර්ෂණ කටයුතු වෙනුවෙන් මු.රෙ 104 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල පත් කර ඇත. | මූලික විමර්ෂණ කටයුතු අවසන් කර ඇති වාහන අනතුරු සම්බන්ධව රක්ෂණ සමාගම් වෙතින් වන්දි ඉල්ලුම් කර ඇත. |
| viii) බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි | අදාල ගැලපුම් මසක් ඇතුලත සිදුකරන ලෙස ගණකාධිකාරිවරුන් දැනුවත් කර ඇත. | ඒ අනුව කටයුතු කරමින් පවතී |
| ix) වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2026.05.06 දිනට වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන, නිලධාරින් තිදෙනකුට අදාල හිඟ ණය ශේෂයන්හි එකතුව රු.388,845.00කි.එම ණය ශේෂයන්ද කඩිනමින් අයකර අවසන් කරන ලෙස ගණකාධිකාරිවරුන් දැනුවත් කර ඇත | ඒ අනුව කටයුතු කරමින් පවතී |
| | | |
| දෙවන කොටස: 96.50<br><br>(i) සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි | -------------------- | 2023.11.30 දිනැති අංක 02/2018(I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම අවලංගු කර ඇත. |
| ii) දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 2 කට වරක් රැස්වී නොතිබුණි. | පරිසර අමාත්‍යාංශ මගින් කමිටුව පිහිටුවන ලෙස උපදෙස් ලබා ඇති නමුත්, දිස්ත්‍රික් මට්ටමින් පරිසර නිලධාරියෙකු පත් කළ නොමැති බැවින්, පරිසර කමිටුව වෙනම පවත්වා ගැනීමේ කටයුතු කළ නොහැකි බව අධ්‍යායනය වේ. නමුත් අවශ්‍ය සියළුම අවස්ථාවලදී අදාළ කමිටු සමාජිකයින් වන සියළු නිලධාරීන් සහභාගී වන දිස්ත්‍රික් | දැනට දිස්ත්‍රික් පරිසර නිලධාරීයෙකුගේ අවශ්‍යතාව පිළිබඳව අදාළ අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී නියමිත පරිදි පරිසර කමිටු පැවැත්වීමට කටයුතු සිදුකරමින් පවතී. |

| | | |
|---|---|---|
| | සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී පරිසර සම්බන්ධ ගැටළු සාකච්ඡා කර තීරණ ගන්නා ලදී. මීට අමතරව විවිධ අවස්ථාවලදී ඩෙංගු රෝග වැනි ආපදාවන් හීදී ද විශේෂ සාකච්ඡා පවත්වා විශේෂ තීරණ ගෙන ඇත. | |

දිසාපති/දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර

අනුපම මංගල වික්‍රමාරච්චි
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
අම්පාර දිස්ත්‍රික්කය

ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර

ඒ.එල්. මහරුෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිසාපති වෙනුවට

**ලේකම්තුමාගේ නිර්දේශය**

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

**ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග**

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.